# <u>නර්තන තරග සඳහා අදාළ කොන්දේසි</u>
## (පොදු උපදෙස් හා කොන්දේසිවලට අමතරව බලපැවැත්වේ.)

**1)** නර්තන කලායතනයකට සහභාගී විය හැකි උපරිම නර්තන තරග ශීර්ෂ සංඛ්‍යාව හතරකි.

**2)** බෙර වාදන තරගය, දිරිගැන්වීමේ තරග ශීර්ෂයක් සේ සැලකෙන අතර, එක් කලායතනයකට බෙර වාදන තරග ශීර්ෂ යටතේ සහභාගී විය හැකි උපරිම තරග සංඛ්‍යාව දෙකකි.(නර්තන තරග ඉසව් හැර)

**3)** තරග සඳහා ඉදිරිපත් වීමේදී,

- **දේශීය නර්තන තරග -** තරගකරුවන් පුහුණු ඇඳුම් කට්ටලයෙන් සහ සරල වේෂනිරූපනයක් භාවිත කර තරගයට ඉදිරිපත්වීම ප්‍රමාණවත් වේ.
- **ඉන්දියානු නර්තන තරග -**
  භරත නාට්‍යම් තරග අංශයට සහභාගීවන තරගකරුවන් සාම්ප්‍රදායික පුහුණු ඇඳුම් කට්ටලයෙන් සහභාගී විය යුතු අතර, සරල වේෂනිරූපනයකින් ද, හිසට මල් වැලක්, පයට මිණි වැලක්(සලංගෙයි), කනට කුඩා කරාබු(ජිමිකි) පමණක් භාවිත කළ යුතුය.

  කථක් නර්තන තරගයට සහභාගීවන තරගකරුවන් සාම්ප්‍රදායික පුහුණු ඇඳුම් කට්ටලයෙන් සහභාගී විය යුතු අතර, සරල වේෂනිරූපනයකින්ද, හිසට මල් වැලක්, පයට මිණි වැලක්(ගුංගුරු), කනට සුදුසු කුඩා කරාබු පමණක් භාවිත කළ යුතුයි.

  **සැ.යු. - රංග වස්ත්‍රාභරණ හා වේෂනිරූපනය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර, තරගයට සහභාගී වීමේදී ඉහත සඳහන් කොන්දේසි වලට අනුකූල විය යුතුය.**

**4)** සියළුම නර්තන තරගයන්හි, සහය ගායකයින්ට හා සහය වාදකයින්ට වයස් සීමාවක් බල නොපාන අතර, විනිශ්චය මණ්ඩලයට දර්ශනය වන පරිදි ඉදිරිපත් කිරීම කළ යුතුය.
**සැ.යු. - මේ සඳහා කලායතනාධිපතිට සහභාගී විය නොහැක.**

**5)** දිස්ත්‍රික් මට්ටමින් තරගයට ඉදිරිපත් වන තරගකරුවන් හෝ අතිරේක තරගකරුවන් හැර වෙනත් තරගකරුවෙකුට පළාත් අවසාන තරගාවලියට සහභාගී විය නොහැකිය.

**6)** ඒක් එක් තරගවලදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.
**දේශීය නර්තන සඳහා**

- සාම්ප්‍රදායික බව සහ නිවැරදි අංගහාර භාවිතය
- රංග වින්‍යාසයන්හි නිර්මාණාත්මක බව හා භාව ප්‍රකාශනය
- විධිමත් ගායනය, වාදනය හා තාලරූප භාවිතය
- අවකාශ භාවිතය
- ප්‍රාසාංගික ඉදිරිපත් කිරීම

**සමූහ වාදනයේදී**

- සාමූහික බව, වාද්‍ය භාණ්ඩයන්ට අදාල ගති ලක්ෂණ, නිර්මාණාත්මක පද භාවිතය, නිර්මාණාත්මක පද භාවිතයෙහි උචිත බව, ප්‍රාසාංගික බව.

**ඉන්දියානු නර්තන සඳහා**

- සාම්ප්‍රදායික බව සහ නිවැරදි අංගහාර භාවිතය
- රංග වින්‍යාසයන්හි නිර්මාණාත්මක බව හා භාව ප්‍රකාශනය
- ගායන වාදන සුසංයෝගය අනුව තාලය හා ලය භාවිතය
- අවකාශ භාවිතය
- ප්‍රාසාංගික ඉදිරිපත් කිරීම

**ඉහත නිර්ණායක හැරුණු කොට ඒකල හා යුගල බෙර වාදනාංග ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් පොදු නිර්ණායක පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.**

- ශාස්ත්‍රීය පද භාවිතය
- වාද්‍ය භාණ්ඩයන්ට අදාළ නිවැරදි අක්ෂර වාදනයෙහි ශක්‍යතාවය
- වාද්‍ය භාණ්ඩයන්ට අදාළ ගති ලක්ෂණය මුල් කොට ගනිමින් වාදනය ඉදිරිපත් කිරීම
- ගායනය සමග වාදනය සමබරව ඉදිරිපත් කිරීමේ ශක්‍යතාවය
- ප්‍රාසාංගික බව

**7)** නර්තන/ වාදන තරග සඳහා එක් එක් දිස්ත්‍රික්කයෙන් ප්‍රථම හා දෙවන ස්ථානය ලබා ගන්නා නර්තනාංග පළාත් අවසාන තරගය සඳහා සුදුසුකම් ලබන අතර, එසේ ප්‍රථම හා දෙවන ස්ථාන ලබාගන්නා නර්තනාංග පළාත් තරගය සඳහා සුදුසු මට්ටමක නොපවතින්නේ නම් එනම් ලකුණු 65 පරිසාධන මට්ටම නොමැති නම් එම නර්තන/ වාදන අංගය පළාත් තරගයට ඉදිරිපත් කිරීමට අවස්ථාව නොලැබේ.

**8)** ඉන්දියානු නර්තන සඳහා අවශ්‍යතාවය පරිදි පටිගත කළ සංගීත ඛණ්ඩයක් හෝ සජීවී පසුබිම් ගායන වාදන ඉදිරිපත් කර හැකි අතර අවශ්‍ය විද්‍යුත් තාක්ෂණික මෙවළම් ඔබ විසින් රැගෙන ආ යුතුය.

**9)** තරගයට ඉදිරිපත් කෙරෙන සියලුම තරග සඳහා ලබා දී ඇති නියමිත අවම කාලය හා උපරිම කාලය පිළිබඳ සැලකිලිමත් විය යුතු අතර, උපරිම කාලයට අමතරව තත්පර 30ක සමාකාලයක් ලබා දී ඇත. එම ලබා දී ඇති සමාකාලය (තත්පර 30)ද ඉක්මවා සිදු කෙරෙන නර්තන/ වාදන තරගයෙන් ඉවත් කිරීම අනිවාර්යවේ.

## තරග ශීර්ෂ

**01. උඩරට ශාස්ත්‍රීය - ඒකල - වයස - අවුරුදු 15-21**

i. පිරිමි - ආවැන්දුම
ii. ගැහැණු - දඩුමොනර කථාව

**02. පහතරට ශාස්ත්‍රීය - ඒකල- වයස අවුරුදු 15-21**

i. පිරිමි - ලිච්ඡවී
ii. ගැහැණු - නාරිලතා (වෙස් මුහුණු රහිත)

**03. සබරගමු ශාස්ත්‍රීය - ඒකල වයස අවුරුදු 15-21**

i. පිරිමි - දළුමුර පාලිය
ii. ගැහැණු - සළු පාලිය

**ඉහත 01,02,03 තරග ශීර්ෂ සඳහා**

සහාය ගායන/වාදන සඳහා - උපරිමය 06 කි.
කාලය - අවම විනාඩි 04, උපරිම විනාඩි 6 කි.(සමාකාලය තත්පර 30)

**04. උඩරට ශාස්ත්‍රීය සමූහ : වයස - අවුරුදු 14 – 21**

i. පිරිමි සමූහ - වීරමුන්ඩ දෙවි කෝල්මුර
ii. ගැහැණු සමූහ - එලවැල දානය

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිමය 06 කි.
කාලය - අවම විනාඩි 05, උපරිම විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**05. පහතරට ශාස්ත්‍රීය සමූහ : වයස අවුරුදු 14 – 21**

i. පිරිමි සමූහ - තෙල්මේ
ii. ගැහැණු සමූහ - නාථමල් අස්න

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිමය 06 කි.
කාලය - අවම විනාඩි 05, උපරිම විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**06. සබරගමු ශාස්ත්‍රීය සමූහ : වයස අවුරුදු 14 – 21**

i. පිරිමි සමූහ - සේරමාන් මඩුපුරය
ii. ගැහැණු සමූහ - සමන් දෙවි මල් යහන්

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිමය 06 කි.
කාලය - අවම විනාඩි 05, උපරිම විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**07. වන්නම් ශාස්ත්‍රීය (මිශ්‍ර සමූහ) : වයස අවුරුදු 14 පහළ**

i. උඩරට - තුරඟා වන්නම
ii. පහතරට - ශුද්ධ තාලය සිංදු වන්නම
iii. සබරගමු - කදම්භ පක්ෂි වන්නම

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිමය 06 කි
කාලය - අවම විනාඩි 05, උපරිම විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**08. නව වන්නම් නිර්මාණය (මිශ්‍ර සමූහ) : වයස අවුරුදු 14 – 21**

- මිශ්‍ර තරගයකි.
- දැනට භාවිතයෙහි පවතින වන්නමක් ඇසුරින් නොවිය යුතුය.
- උඩරට/ පහතරට/ සබරගමු සම්ප්‍රදායට අයත් වන්නම් ආකෘතියට අනුව නිර්මාණය කර තිබිය යුතුය.

නර්තනය සඳහා - අවමය 06කි.උපරිමය 12කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිම 10කි
කාලය - අවම විනාඩි 05 කි. උපරිම විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**09. ජන නැටුම් : වයස- අවුරුදු 12න් පහළ**

i. පිරිමි සමූහ - කඩු නැටුම
ii. ගැහැණු සමූහ - ඔළිඳ කෙළිය
iii. මිශ්‍ර - කුරහන් කැපීම (ජන නර්තන ඇසුරින්)

නර්තනය සඳහා - අවමය 06කි.උපරිමය 12කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිම 10කි
කාලය - අවම විනාඩි 05කි. උපරිම විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**10. ඉන්දියානු නැටුම්- භරත නාට්‍යම් - වයස- අවුරුදු 12 - 21**

i. ගැහැණු සමූහ - ආයර්ෂේරිය ශබ්දම්
ii. මිශ්‍ර සමූහ - හින්දෝලම් තිල්ලානා

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිම 05කි.
කාලය - අවම විනාඩි 05කි. උපරිමය විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**11. ඉන්දියානු නැටුම්- කථක් - වයස අවුරුදු 12 -21**

i. ගැහැණු සමූහ - චතුරංග
ii. මිශ්‍ර සමූහ - භජන්

නර්තනය සඳහා - අවමය 06 කි. උපරිමය 12 කි.
සහාය ගායන/වාදන සඳහා - උපරිම 05කි.
කාලය - අවම විනාඩි 05 කි. උපරිමය විනාඩි 06 කි.(සමාකාලය තත්පර 30)

**12. සමූහ වාදනය - (මිශ්‍ර) අවුරුදු 12– 21**

- දේශීය තූර්ය භාණ්ඩ හා ආදේශ භාණ්ඩ යොදාගත යුතුය.
- උඩරට, පහතරට, සබරගමු ශාන්ති කර්මයන්හි වාදන ආශ්‍රයෙන් කළ නිර්මාණයක් විය යුතුය. එසේ වුවත් එම බෙර පද ඇසුරෙන් සිදු කළ නිර්මාණාත්මක බෙර පද, උචිත පරිදි භාවිත කළ හැකිය.

වාදක කණ්ඩායම - අවමය 08 කි. උපරිමය 20 කි.
කාලය - අවමය විනාඩි 05, උපරිමය විනාඩි 08 කි.(සමාකාලය තත්පර 30)

# බෙර වාදන තරග සඳහා අදාළ කොන්දේසි

- ඒකල  බෙර වාදනය සඳහා ගැහැණු, පිරිමි වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් විය යුතුය.
- තරග ශීර්ෂ, වයස් සීමාව හා කාලය පහත පරිදි වේ.
- **මේ සඳහා අදාළ නිර්ණායක සහ කොන්දේසි නර්තන තරග උපදෙස් පත්‍රිකාවෙහි සඳහන්වේ.**

| **අනු අංකය** | **තරග ශීර්ෂ** | **සම්ප්‍රදාය** | **වයස් සීමාව අවුරුදු** | **කාලය විනාඩි අවම / උපරිමය** |
|---|---|---|---|---|
| 01 | ඒකල බෙර වාදන (ගැහැණු) | උඩරට/පහතරට/සබරගමු | 15 -18 අතර | විනාඩි 05 / විනාඩි 07 |
| 02 | ඒකල බෙර වාදන (පිරිමි) | උඩරට/පහතරට/සබරගමු | 15 -18 අතර | විනාඩි 05 / විනාඩි 07 |
| 03 | යුගල බෙර වාදන (ගැහැණු-ගැහැණු) | උඩරට/පහතරට/සබරගමු | 15 – 21 අතර | විනාඩි 06 / විනාඩි 08 |
| 04 | යුගල බෙර වාදන (පිරිමි-පිරිමි) | උඩරට/පහතරට/සබරගමු | 15 – 21 අතර | විනාඩි 06 / විනාඩි 08 |

**තරග ශීර්ෂ**

## 01. ඒකල බෙර වාදනය

i. උඩරට - මගුල් බෙර වාදනය - සිව් වට්ටම් ඇසුරෙන්
ii. පහතරට - මගුල් බෙර වාදනය - පළමු,දෙවන,තෙවන වට්ටම් ඇසුරින්
iii. සබරගමු - මහා මංගල දවුල් වාදනය ඇසුරින්

## 02. යුගල බෙර වාදනය

i. උඩරට - අත්‍යා බෙර පද ඇසුරෙන්
ii. පහතරට - පහතරට බෙර පෝය හේවිසිය (සතර වට්ටම් සුරල්ඇසුරෙන්)
iii. සබරගමු - අත්‍යා දවුල් පද ඇසුරෙන්

**කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ**
**ලේකම්**
**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**
**බස්නාහිර පළාත**